වියපත් නළලත රැළි වැටිලා. කළු සන රාමුවට කොටු වුණ උත්තල කාච දෙක තුළින් ඇස් දෙක පෙනෙන්නෙ තරමක් ලොකුවට. ඒ ඇස් ස්වර සටහන දිගේ වමේ ඉඳන් දකුණට. විභාග යෙන් විභාගයට. ආවර්තයෙන් ආවර්තයට. ස්ථායි කොටසින් අන්තරාවට. වම් මහපටැ'ගිල්ල ඇඟිලිවල පුරුක් ගණිනවා මාත්‍රාවෙන් මාත්‍රාවට. කලියෙන් කලියට, සම් එකෙන් සම් එකට හස්ත මුද්‍රා. වයලීනය සුරතේ. වියපත් ඇඟිලි තුඩු පිසිකාටෝ ක්‍රමයට තත් අතර.

හිත සසළ කරවන වීණාගේ ගැස්සෙන ඇස්. රත් දෙතොල් අතරින් නිරතුරුව පානා මදහස. රෝස පැහැගත් උණුසුම් කොපුල් තල. දෙදණ තෙක් විදා හල සිකි පිල් කළඹ. යොවුන් තුනු රුසිරෙන් ලත් අමන්දානන්දයට එක් වන ආදර හැඟුම්. ඒ හැඟුම්වල ආහ්ලාදයෙන් තෙපලන බොළඳ බස්. ජීවිතයේ නව යොවුන් වියේ සිතක කුළුඳුල් ප්‍රේමයකින් ලබන උද්දීපනය. මේ හැම දෙයක් ම කැටිවුණේ නිරායාසයෙන්මයි තනුවට.

"හොඳයිනෙ අයිෂෙ...!" ඒ වයලින් වාද්‍ය විශාරද ප්‍රවීන් රසදේවයන්ගේ රෙකමදාරුව.

"වැඩකට ගන්න බලමු..." මාස්ටර්ගේ ස්වර සටහන් ගොනු අතරට මේ ස්වර සටහනත් පරිස්සමට. හොඳ වෙලාවට ඡායා පිටපතක් අරන් තියාගත්තෙ. ඒක ගමේ ගෙදර ලාච්චුවේ පරිස්සමට.

ඇත්තටම 'හොඳයිනෙ' අගැයීමට වඩා වැඩි යමක් ඒ තනුවේ තිබුණේ ම නැද්ද? නැතිනම් වියපත් අයෙකුට ඒ භාවයන් දැනෙන්නේ නැද්ද?

"කලාකරුවන් වියපත් නොවේ!"

එහෙම නම් එක් සංගීත ක්‍රමවේදයකට නැඹුරු වුණ වින්දන ශක්තියකට නැවුම් නිර්මාණයක් 'දැනෙන්නෙ' නැද්ද?

"සංගීතය විශ්වමය භාෂාවකි!"





අම්මාගේ අසනීප තත්වය නරක අතට. ජීවිතය පාලනය කරන කාලයත්, මුදලුත් ඒ වෙනුවෙන්. රැකියා කටයුතු මඟහරින්නේ කොහොමද? "රසාංජලී"යේ කටයුතු මඟහැරුණේ ඔය විදියට. "රසාංජලිය" විතරක් නෙවි, වීණාත්...

නගරයේ හැදී වැඩුණ, රටම දන්නා කලාකරුවකුගේ දක්ෂ දියණියට තිබුණ ඉල්ලුම ඉහළයි. කාලයත්, මුදලුත් වීණාට බලපෑවෙ වෙනත් විදියකට. වීණාව ජීවිතයෙන් සදහට ම මඟහැරිලා ගියේ ඒ නිසා.

නංගීත්, ඇයගේ සැමියාත් එක්ක මොන තරම් හැලහැප්පුනත් අම්මාට ජීවිතය දෙන්න බැරිවුණා. ප්‍රවීණ වයලීන් වාද්‍ය විශාරද ප්‍රවීන් රසදේවයන් අන්තිමට දකින්න ලැබෙන්නෙ අම්මාගේ අවසන් කටයුතු කළ දවසේ.

තුන් මාසේ පින්කමට පිරිකර ගන්න අවිස්සාවේල්ලේ ගියේ හැම දෙයක් ම එක ගමනින් ම කරගන්න පුළුවන් නිසා. පිරිකර විකුණන්න තිබුණ කඩයේ සංගත තැටිත් විකුණන්න තිබුණා. වයලීන පවුලේ සේයා රුවලින් නිර්මාණය වුණ කවරය ඇති සංගත තැටියට ඇස් ඇදිලා ගියේ පෙර පුරුද්දට.

'රසාංජලී - ස්වර සංහිතා'

වයලින් වාද්‍ය විශාරද ප්‍රවීන් රසදේවයන්ගේ නවතම තනු හා සංගීත සංකලන...

පිරිකර අතරට ඒ සංගත තැටියත් එකතු වුණේ නො දැනීම. කුතුහලයෙන් හිත පිරිලා. අනික් අය පින්කමේ වැඩ කටයුතුවල. සංගත තැටිය අහනකල් ඉවසිල්ලක් නෑ. වැදුණා කාමරයට තැටි වාදන යන්ත්‍රයත් එක්ක. වහගත්තා කාමරයේ දොර හෙමිහිට.

'වයලින් සංධ්වනි අංක හය - ප්‍රේම මංජුසා'

දෙයියනේ...! මේක කොහොම අදහන්නද? කුළුඳුල් ප්‍රේමයෙන් ප්‍රකම්පනය වෙලා ඒ ආහ්ලාදයෙන් නිර්මාණය වුණ තනුව. පසුබිම් වාද්‍ය ඛණ්ඩ පිරිවරාගෙන මහා මියැසි වටපිටාවක. ඒත්...?